# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No: 10120

ෆැක්ස් / தொலைநகல / Fax: 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone: 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site: www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail: dir.media@police.gov.lk


---

මගේ අංකය / எனது இலக்கம் / My NO: 389 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No: / 2024

දිනය / திக / Date: 05/03/2024 පැය 1835

**මාධ්‍ය නිවේදනය**

**ව්‍යාජ මුදල් නෝට්ටු සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොතුහැර පොලිස් ස්ථානය.**

2024.03.04 වන දින දහවල් කාලයේ පොතුහැර පොලිස් වසමේ කුරිපොත්ත ප්‍රදේශයේදී පොතුහැර පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් සැකකටයුතු පුද්ගලයෙකු පරීක්ෂා කර ඔහු **සන්තකයේ තිබී රුපියල් 5000 ව්‍යාජ මුදල් නෝට්ටු 45 ක් සමඟ සැකකරු අත්අඩංගුවට** ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 29 ක් වූ පොල්පිතිගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

තවද මෙම සැකකරු ව්‍යාජ මුදල් නෝට්ටු මුද්‍රණය කර සන්තකයේ තබා ගැනීම සම්බන්ධයෙන් එම මුදල් මුද්‍රණය කිරීම සඳහා යොදා ගත් උපකරණ සමඟ මීට පෙර අත්අඩංගුවට පත්ව ගරු අධිකරණය මඟින් නඩු පවරා දැනට ඇප මත සිටින අයෙකු බවට අනාවරණය වී ඇත.

පොතුහැර පොලිසිය මඟින් වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**